සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

9 ශ්‍රේණිය

# කතෝලික ධර්මය

කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01. කිතුන්වන්ට විරුද්ධව පැමිණි පීඩනවලට මුහුණ දුන් විශ්වාසකයින් දිරිගැන්වීම සඳහා ලියන ලද ග්‍රන්ථයකි.

(1) ජෝබ් (2) මාක් (3) එළිදරව්ව (4) ක්‍රියාපොත

02. ජනවන්දනාව තුළ ගීතාවලියේ ගීතිකා භාවිතා වන අවස්ථා වන්නේ,

A - පිළිතුරු ගීය B - ශුද්ධ පැය C - යාම යැදුම D - සැඳෑ යාම යැදුම

(1) A, B, C (2) A, C, D (3) A, B, D (4) B, C, D

03. දෙවියන් වහන්සේ ආදම් සහ ඒව රැගෙන ඒදන් උයනේ පදිංචි කරවූයේ,

(1) උයන වගා කර එය රැකබලා ගැනීම පිණිසය.

(2) දරු සම්පත් ලබා වැඩි වර්ධනය වන පිණිසය.

(3) බෝවී පොළව පුරා පැතිරෙන පිණිස ය.

(4) දෙවියන් වහන්සේට සේවය කරන පිණිසය.

04. දෙවියන් වහන්සේ ආදම් සහ ඒවට හම් වස්ත්‍ර සාදා දීමෙන් පෙන්නුම් කරන්නේ,

(1) දෙවියන් වහන්සේ ඔවුන්ව අත් නොහරින බවය.

(2) මිනිස් දුබලතා අභියස ඇති දේව දයාව ය.

(3) දෙවියන් වහන්සේගේ ආදරය හා රැකවරණය ය.

(4) අපත් අන් අයට කරුණාව දැක්විය යුතු බවය.

05. නව මැවිල්ලක ආරම්භකයා වශයෙන් දෙවියන් වහන්සේ නෝවාව තෝරා ගත්තේ,

(1) ඔහුගේ යහපත්කම නිසාය. (2) ඔහුගේ දරු පරපුර නිසාය.

(3) නෝවාගේ නැණවත්කම නිසාය. (4) නෝවාට නැවක් තිබූ නිසාය.

06. "නුඹට ඇති බලසම්පන්නකම මෙහෙයවා මිදියන්වරු අතින් ඊශ්‍රායෙල්වරුන් ගලවන්න නුඹ යවන්නේ මමය." සමිඳාණන් වහන්සේ මෙලෙස යවනු ලැබූ වීරවරයා,

(1) සැම්සෙන්ය. (2) ගිඩියොන්ය. (3) බාරුක්ය. (4) ජෙප්තාය.

07. ගීතාවලියේ 51 වැනි ගීතිකාව නිර්මාණය කළේ,

(1) සලමොන් රජුය. (2) දාවිත් රජුය. (3) සාවුල් රජුය. (4) ආහාස් රජුය.

08. තෙවන දේව පනත කඩවීම සඳහා උදාහරණයකි.

(1) පාසලට පමාවී පැමිණීම. (2) ඉරුදින දිව්‍ය පූජාවට නොයාම.

(3) විහිලුවට බොරුවක් කීම. (4) ඉරුදින රෝගියෙකු බලාගැනීම.

09. පේදුරු 3:8-10 අනුව ඇදහිල්ලේ ස්ථිරව සිටීමට අප කළ යුත්තේ,

(1) පාපය බැහැර කිරීමය. (2) යක්ෂයා සිංහයෙකු මෙන් දැකීම.

(3) සිහිසන් ඇතිව සිටීමය. (4) දුක් විඳීමට කැමති වීමය.

10. රෝගීන් ආලේපය හා බැඳුණු මාර්ගෝපකාර ප්‍රසාද නිධානය වන්නේ,
   (1) සමගි සන්ධානය ය.   2) දිව්‍ය සත්ප්‍රසාදය ය.
   (3) අභිවෘද්ධි ආලේපය ය.   (4) පූජකවරය ය.

11. නිරාගින්නට ගොදුරු වීමට හේතුව,
   (1) තම සහෝදරයාට 'මෝඩයා' කියා ගැරහීම ය.
   (2) තම සහෝදරයාට 'ජඩයා' කියා ගැරහීමය.
   (3) තම සහෝදරයා කෝප කිරීමය.
   (4) තම සහෝදරයා ඝාතනය කිරීම ය.

12. විවාහකයන් සමඟ අනියම් ප්‍රේම සම්බන්ධතා පවත්වා ගැනීම තහනම් කරන දේව පනත වන්නේ,
   (1) තුන්වන පනත ය.   (2) අටවන පනත ය.
   (3) නවවන පනත ය.   (4) දහවන පනත ය.

13. 'මරණයට පත්වන්නට සිදුවූවත් මාගේ දේව ජීවිතය නැතිකර නොගනිමි.' යි ගිවිසගත් සාන්තුවරිය වන්නේ,
   (1) ශුද්ධ වූ ඇග්නස් තුමිය ය.   (2) ශුද්ධ වූ මරිය ගොරෙත්ති තුමිය ය.
   (3) ශුද්ධ වූ හෙලේනා තුමිය ය.   (4) ශුද්ධ වූ පර්පෙතුවා තුමිය ය.

14. විශ්වාසය තුළ පූජාසනයක් සාදා දෙවියන් වහන්සේට යාච්ඤා කර ප්‍රාතිහාර්යය සිදු කළේ,
   (1) එළියා දිවැසිවරයා ය.   (2) එලීෂා දිවැසිවරයා ය.
   (3) නාතාන් දිවැසිවරයා ය.   (4) ජෝනා දිවැසිවරයා ය.

15. ඔබේ ජීවිතය අර්ථවත් වීමට නම්,
   (1) අන් අය උදෙසා ජීවත් විය යුතුය.   (2) උදාර පෞරුෂයක් ගොඩනගා ගත යුතුය.
   (3) දිනපතා දන්දිය යුතුය.   (4) සභාවේ දියුණුවට අත දිය යුතුය.

16. 'මෙහෙසුරු දිවැසිවර' යන නම ඔබට දෙනු ඇත.' මෙම පාඨය අදාළ වන්නේ,
   (1) ක්‍රිස්තුස් වහන්සේට ය.   (2) ස්නාවක ජොහාන් තුමාට ය.
   (3) සිම්යොන් දිවැසිවරයාට ය.   (4) සෙකරියස් තුමාට ය.

17. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව ක්‍රිස්තියානි යාච්ඤාවේදී අප වඩාත් උත්සාහ කළ යුත්තේ,
   (1) සභාවේ නිල යැදුම් උච්චාරණය කිරීමටය.
   (2) ජපමාලය උච්චාරණය කිරීමටය.
   (3) ක්‍රිස්තුස් වහන්සේගේ අභිරහස් භාවනා කිරීමටය.
   (4) අපට අවශ්‍ය දේ ඉල්ලා ගැනීමටය.

18. 'ධ්‍යානයට සමවැදීම යනු කිට්ටු මිතුරන් අතර අදහස් හුවමාරු කර ගැනීමය.' මෙසේ පවසන්නේ,
   (1) අසීසියේ ශුද්ධ වූ ප්‍රැන්සිස් තුමා.   (2) ශුද්ධ වූ තෙරේසා මව්තුමිය.
   (3) සාන්ත ඇග්නස් තුමිය.   (4) සාන්ත තෙරේසා තුමිය.

19. කිතුනු අපගේ අධ්‍යාත්මික ජීවිතය වර්ධනය කර ගැනීමට අප කළ යුත්තේ,
   (1) යාච්ඤාවේ විවිධ ප්‍රභේද භාවිතා කිරීම ය.   (2) යැදුම් මෙහෙයන් සංවිධානය කිරීම ය.
   (3) නිවැරදි ඉරියව්වකින් යාච්ඤා කිරීම ය.   (4) නුවාන හා කිතුනු සංඝ රැස්වීම් තැබීම ය.

20. 'අසිපා' (ASIPA) යන්නෙහි අරුත වන්නේ,
   (1) ආසියානු අධ්‍යාත්මික පෝෂණ සේවා සමුළුවය.
   (2) ආසියාතික රදගුරු අපෝස්තලික සමුළුවය.
   (3) ආසියාතික ඒකාග්‍ර පෝෂණ සේවා යොමුවය.
   (4) ආසියාතික රදගුරු සාංඝිකත්වයේ යොමුවය.

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

01. (i) නව ගිවිසුමේ ඇතුළත් සංදේශ දෙකක් ලියා දක්වන්න.
(ii) ශුද්ධවර මාක්තුමාගේ ශුභාරංචිය රචිත කාලය හා එම සුබාරංචිය හඳුන්වන වෙනත් නමක් ලියන්න.
(iii) පාපයේ ප්‍රතිඵල ලෙස ඒවට හිමි වූ දඬුවම් දෙකක් ලියන්න.
(iv) පූජක සාමුවෙල් විසින් අභිෂේක කරන ලද රජවරු දෙදෙනා නම් කරන්න.
(v) ඉෂ්ට වරප්‍රසාදය හරහා ලැබෙන දේව වරම් දෙක ලියන්න.
(vi) සදාකාලික දඬුවමින් මිදීමට ඇති දේව ප්‍රසාද නිධානය හඳුන්වන නම් දෙකක් ලියන්න.
(vii) කායින් හා ආබෙල් යන දෙදෙනාගේ ජීවනෝපායන් වෙන වෙනම ලියන්න.
(viii) හයවන දේව පනතට විරුද්ධ පාපී ක්‍රියා දෙකක් ලියන්න.
(ix) භාවනාවේදී විමසිලිමත් වන කරුණු දෙක ලියන්න.
(x) අසීසියේ ශුද්ධ වූ ප්‍රැන්සිස් මුනිතුමාගේ යාච්ඤාවේ ඇතුළත් කරුණු දෙකක් ලියන්න.(ල. 2x10=20)

02. (i) ශුද්ධ බයිබලයේ ඇතුලත් ඉතිහාස පොත් 2 ක් නම් කරන්න. (ල. 02)
(ii) නව ගිවිසුමේ හසුන්පත් ලියූ ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රාවකයන් තිදෙනෙක් නම් කරන්න. (ල. 03)
(iii) වත්මන් සමාජය තුළ එදිනෙදා ජීවිත පැවැත්මට දේව වචනය ඉවහල් වන ආකාරය කරුණු පහකින් ලියන්න. (ල. 05)

03. (i) ගීතාවලියේ සඳහන් වන ගීත වර්ග දෙකක් ලියන්න. (ල. 02)
(ii) ගීතාවලිය හඳුන්වන වෙනත් නම් තුනක් ලියන්න. (ල. 03)
(iii) විශ්වාසයෙන් යුතුව අයැදීම තුළ ඔබ දේව ආදරය අත්දුටු අවස්ථාවක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

04. (i) එළිදරව් සාහිත්‍යයට අයත් ග්‍රන්ථ දෙක නම් කරන්න. (ල. 02)
(ii) සමදර්ශක සුභාරංචි තුන නම් කරන්න. (ල. 03)
(iii) දේව වචනය කිතුනු ජීවිතයෙන් වෙන් කළ නොහැකිය. මෙම කියමන සනාථ කිරීමට කරුණු පහක් ඉදිරිපත් කරන්න. (ල. 05)

05. (i) කුරුස ගසේදී ජේසුස් වහන්සේ සතුරන්ට සමාව දෙමින් කළ ප්‍රකාශය ලියා දක්වන්න. (ල. 02)
(ii) ස්වර්ගයට මොරගසන පව් තුනක් ලියන්න. (ල. 03)
(iii) පාපයට වැටුණු මිතුරෙකු නැවත දෙවිඳුන් වෙත ගෙන ඒමට ඔබ ගන්නා ක්‍රියාමාර්ග 05 ක් ලියන්න. (ල. 05)

06. (i) 6, 9 පනත් නම් කරන්න. (ල. 02)
(ii) චරිත පාරිශුද්ධිය පවත්වා ගැනීම සම්බන්ධ ආදර්ශවත් චරිත තුනක් නම් කරන්න. (ල. 03)
(iii) නව යොවුන් වියේ පසුවන ඔබ පිවිතුරු දිවියක් ගත කිරීම සඳහා අනුගමනය කරන ක්‍රියාකරකම් පහක් ලියන්න. (ල. 05)

07. (i) ඔබ දන්නා නව ගිවිසමේ ඇතුළත් ප්‍රශංසා ගීත 2 ක් නම් කරන්න. (ල. 02)
(ii) යාච්ඤාවේ ප්‍රභේද තුන නම් කරන්න. (ල. 03)
(iii) ඔබ දෙවියන් වහන්සේගෙන් ලබාගත් දීමනා හා වරප්‍රසාද වලට ප්‍රශංසා කිරීම සඳහා සුදුසු යාච්ඤාවක් නිර්මාණය කරන්න. (ල. 05)